Department of Sociology
University of Colombo



Social Sciences and Humanities in the Digital Age and in Pandemic Times

# Annual Research Symposium 2021

## Book of Abstracts

1921 - 2021
University of Colombo
Pioneering Arts and Science in Higher Education

Annual Research Symposium 2021

on

Social Sciences and Humanities in the Digital Age and in Pandemic Times

# Book of Abstracts

Department of Sociology, Faculty of Arts, University of Colombo

26th March 2021

Annual Research Symposium of the Department of Sociology

ISBN:  ISBN 978 – 955 – 703 – 099 – 9

Bar Code: 9 789557030999

Department of Sociology

University of Colombo, Sri Lanka

All rights reserved. No part of this publication may be reproduced, store and transmitted in any form, or by any means without prior written permission from the editors. The views expressed in the individual papers are of the individual authors. The editors are not liable to anyone for any loss or damage caused by any error or omission in the papers, whether such error or omission is the result of negligence or any other cause. All and such liability is disclaimed. The reader should verify the applicability of the information to particular situations and check the references prior to any reliance thereupon. Since the information contained in the book is multidisciplinary and professional in nature, the readeris urged to consult with an appropriate licensed professional prior to taking any action or making any interpretation that is within the realm of a licensed professional practice.

Department of Sociology
Faculty of Arts
University of Colombo
Colombo 03
Sri Lanka

Enquires:

Tel: 00942500452

Fax: 00942500452

Email: info@soc.cmb.ac.lk

# මාර්ගගත ඉගෙනුම් ක්‍රමයෙන් සිංහල භාෂාව ඉගෙනීමේ දී හා ඉගැන්වීමේ දී මුහුණපෑමට සිදු වන අභියෝග (තෝරා ගත් ජාත්‍යන්තර පාසලක සිසුන් හා ගුරුවරුන් ඇසුරෙන්)

නදීකා සඳමාලි[1], රෂිනි කෞශල්‍යා[2]

කොවිඩ් 19 වෛරසය වත්මනෙහි ගෝලීය වසංගත තත්ත්වයක් බවට පත් ව ඇති අතර, ශ්‍රී ලාංකේය ජනතාව එමගින් විවිධ දුෂ්කරතාවන්ට මුහුණපා ඇත. එමෙන්ම පාසල් ශිෂ්‍ය ප්‍රජාව දැඩි අපහසුතාවන්ට මුහුණ දෙන අතර ජාත්‍යන්තර පාසල් සිසු පිරිස ද ඒ අතර වෙයි. මේ වන විට ජාත්‍යන්තර පාසල්වල සිසුන්ට මාර්ගගත ඉගෙනුම් ක්‍රමය යටතේ ඉගැන්වීම් කටයුතු ආරම්භ වී ඇති අතර, මේනිසා බොහෝ සිසු දරු දැරියෝ ද ගුරුවරු ද විවිධ ගැටලුවලට මුහුණ දෙති. මෙම පර්යේෂණයේ දී එම ජාත්‍යන්තර පාසල්වල සිසුන්ට හා ගුරුවරුන්ට සිංහල භාෂාව මාර්ගගත ඉගෙනුම් ක්‍රමයෙන් ඉගෙනගැනීමේ දී හා ඉගැන්වීමේ දී මුහුණ දීමට සිදු වන අභියෝග පවතින්නේ ද යන ගැටලුවට අදාළ ව දත්ත සොයා බලන ලදී. මාර්ගගත ඉගෙනුම් ක්‍රමය මගින් සිංහල භාෂා ව්‍යවහාරය හා අධ්‍යයනයට ඇති බාධා අවම කර ගැනීම, ඉගැන්වීමේ දී ඇති වන දුෂ්කරතා සඳහා විසඳුම් සොයා ගැනීම මෙහි දී අරමුණු වේ. මෙම අධ්‍යයනය සඳහා ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා ඇසුරෙන් ප්‍රාථමික දත්ත ලබා ගෙන ඇති අතර, සිසුන්ට ප්‍රායෝගික වශයෙන් මාර්ගගත ඉගැන්වීම් සමග සම්බන්ධ වීමේ දී ඇතිවන ගැටලු සාකච්ඡා කරන ලදී. මේ සඳහා පිළිතුරු සපයන්නන් ලෙස ජාත්‍යන්තර පාසලේ ශාඛා පහෙහි 10 වසර සිසුන් දෙදෙනා බැගින් දහයක් හා ගුරුවරුන් දහයක් තෝරා ගත් අතර, ප්‍රශ්නාවලි දෙකක් ඒ සඳහා යොදා ගෙන ඇත. මෙහි දී ජාත්‍යන්තර පාසලක ශාඛා පහෙහි කේම්බ්‍රිජ් විෂය ධාරාවන්ට සීමා වන අතර, එය තවදුරටත් සීමා කර ගනිමින් දහය වසර ළමුන් හා ගුරුවරුන් නියැදියක් ලෙස තෝරා ගනිමින් ප්‍රශ්නාවලි ඉදිරිපත් කර තොරතුරු ලබා ගැනීම සිදු කෙරෙයි. ව්‍යාකරණ දෝෂ, අක්ෂර වින්‍යාසය වැනි භාෂාමය ගැටලු වර්ධනය වීම, ප්‍රායෝගික ගැටලු හමුවේ සිසුන්ට අඛණ්ඩ ව අධ්‍යයන කටයුතුවලට සම්බන්ධ වීමට නො හැකි වීම, දෙමව්පියන්ට පවත්නා නව තාක්ෂණික දැනුමෙහි දුබලතා, ගුරුවරුන්ට කාල කළමනාකරණයේ පවතින අපහසුතාව හා එනිසා මානසික ආතතියෙන් පසුවීම වැනි ගැටලු මේ අනුව හඳුනාගත හැකි විය.

**ප්‍රමුඛ පද - කොවිඩ් - 19 වෛරසය, මාර්ගගත ඉගෙනුම් ක්‍රමය, ජාත්‍යන්තර පාසල, ගුරු - සිසු ප්‍රජාව**

[1] කථිකාචාර්ය (ආධුනික), සිංහල අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.
[2] ගුරුවරියකි,, රෝයල් ඉන්ස්ටිටියුට් ජාත්‍යන්තර පාසල, මහරගම.